සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/02/01/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ..........................................

දිනය / திகதி / Date: 2022.02.28

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2021/21 ට පළමු එකතුව**

සියළුම විධායක කමිටු /පාලක මණ්ඩල සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමණාකරුවන් වෙත.

**<u>Covid - 19 වෛරස බලපෑම හේතුකරගෙන, බැංකු සාමාජිකයන් විසින් ගෙවීම් ප්‍රමාද කරන (සිතා මතා නොවන) ලද ණය මුදල් ආපසු අය කරගැනීමේ වැඩසටහන යටතේ, ණය ප්‍රතිලේඛනගත කිරීමේ (Resheduling) පහසුකම දියත් කිරීම.</u>**

**01.** සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ - 2021/21 මගින් Covid - 19 වෛරස බලපෑම මත, සමෘද්ධි බැංකු/ බැංකු සමිති මගින් හඳුනාගත් ණයකරුවන් සඳහා ණය ආපසු ගෙවීමට සහනයක් ලබාදීමේ අරමුණින් ණය ප්‍රතිලේඛනගත කිරීමේ වැඩසටනක් හඳුන්වා දෙන ලදී.

මෙම වැඩසටහන යටතේ 2022.02.28 දින දක්වා ණය ප්‍රතිලේඛනගත කිරීමට අවසර දෙන ලදී..

02. මෙම වැඩසටහන යටතේ ණය පහසුකම් ලබාදීමේ කාලය තවදුරටත් දීර්ඝ කරන ලෙස සමෘද්ධි බැංකු / බැංකු සමිති වලින් ඉල්ලීම් රැසක් ලැබී ඇත. එම ඉල්ලීම් 2022.02.25 දින පැවති සමෘද්ධි බැංකු සහ බැංකු සමිති කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කල අතර, කළමනාකරණ මණ්ඩලය විසින් 2022.03.31 දක්වා ණය ප්‍රතිලේඛනගත කිරීම වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කරන ලෙස දැනුම් දී ඇත. ඒ අනුව ණය ප්‍රතිලේඛනගත කිරීමේ කාලය 2022.03.31 දක්වා දීරඝ කරන ලද බව දන්වමි.

03 ණය ප්‍රතිලේඛනගත කිරීමේ කාලය දීර්ඝ කිරීමත් සමඟ සමෘද්ධි බැංකු සහ බැංකු සමිතිවල බොල් ණය වෙන් කිරීම ද 2022.03.31 දක්වා තාවකාලිකව අත්හිටවූ බව ද දන්වමි.

04. ණය ප්‍රතිලේඛනගත කිරීමට අදාල කටයුතු පරිගණක මෘදුකාංගය තුල ද තවදුරටත් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම පවතින බව ද දැනුම් දෙමි.

අනෙකුත් උපදෙස් නොවෙනස්ව පවතින බව ද, ඒ අනුව ඉදිරි කටයුතු කරන ලෙස දන්වා සිටිමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය.- කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.- කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - .ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රාදේශීය ලේකම්වරුන්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
6. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. -දැ.ගැ.හා අ.ක.ස

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |